සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

42571

**දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**Department of Education, Southern Province**

33 S I

**දෙවන වාර පරීක්ෂණය, 2018 ජූලි**
**Second Term Test, July 2018**

**10 ශ්‍රේණිය**
**Grade 10**

**ඉතිහාසය- I**
**History - I**

**පැය එකයි**
**One hour**

විභාග අංකය ..............................

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- අංක 1 - 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.
- එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති උපදෙස් ද කියවා ඒවා ද පිළිපදින්න.

---

(01) මහාවංශ ටීකාව ලෙස හඳුන්වන කෘතිය වන්නේ,
1. උත්තර විහාර අට්ඨ කථාව
2. ජාතකට්ඨ කථාව
3. වංසත්ථප්පකාසිනී
4. විනයට්ඨ කථාව

(02) ශ්‍රී ලංකාවේ ශාසන ඉතිහාසය පිළිබඳව ලියවී ඇති වැදගත් ග්‍රන්ථයක් වූයේ,
1. නිකාය සංග්‍රහය
2. පූජාවලිය
3. ථූපවංසය
4. ධාතුවංසය

(03) පැරණි කාසි පිළිබඳ හදාරන විෂය වන්නේ,
1. සමාජ විද්‍යාව
2. රසායන විද්‍යාව
3. පුරා විද්‍යාව
4. නාණක විද්‍යාව

(04) ශ්‍රී ලාංකීය ජාතික උරුමයක් වන පුරා වස්තු ආරක්ෂා කිරීම සිදුකල යුත්තේ මින් කුමන කරුණක් නිසා ද ?
1. විදේශ සංචාරකයින්ගේ ආකර්ශනයට හේතුවන නිසා
2. අනාගත පරපුර දැකගත යුතු නිසා
3. ශ්‍රී ලාංකීය අනන්‍යතාව පෙන්නුම් කරන නිසා
4. පෙර රජ දවස විසූවන්ගේ නිර්මාණශීලී බව දැක ගැනීමට

(05) අශ්ව හිස සහ මිනිසා දක්වෙන මූර්තිය පිහිටා ඇත්තේ,
1. අභයගිරියේය.
2. ඉසුරුමුණි විහාරයේය.
3. නිශ්ශංකලතා මණ්ඩපයේය.
4. ලංකාරාමයේය.

(06) පහතින් දක්වා ඇති X තීරුව Y තීරුව හා ගැළපූ විට වඩා නිවැරදි පිළිතුර වන්නේ,

| X | | Y |
|---|---|---|
| 1. ග්‍රීක මූලාශ්‍රය | A - | හියු සියැං භික්ෂුවගේ දේශාටන වාර්තා |
| 2. රෝම මූලාශ්‍රය | B - | බැල්ඩියස්ගේ ලංකා පුරාවෘත්තය |
| 3. පෘතුගීසි මූලාශ්‍රය | C - | මෙගස්තිනීස්ගේ ඉන්ඩිකා |
| 4. ඕලන්ද මූලාශ්‍රය | D - | ප්ලීනිගේ නැචුරලිස් හිස්ටෝරියා |
| | E - | රිබෙයිරෝගේ ලංකා ඉතිහාසය |

1. CDEB
2. CBAE
3. CAEB
4. DEAB

(07) දකුණු ඉන්දියාවේ දී රචිත ශ්‍රී ලංකාව පිළිබඳ තොරතුරු ඇතුලත් ග්‍රන්ථය වන්නේ,

1. ශේගරාසශේකර මාලෛ  2. සාරජ්ජදීපනී
3. යාල්පාන වෛපව මාලෛ  4. පදිර්රුපත්තු

(08) ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් ගල් මෙවලම් ලැබී ඇති වැල්ලේගංගොඩ ප්‍රදේශයේ ඉරණමඩු සැකැස්මට අයත් බොරළු තට්ටුව කාල නිර්ණය අනුව වසර.

1. අසූ දහසකි.  2. අනූ දහසකි.
3. එක්ලක්ෂ විසිපන්දහසකි.  4. තිස් හය දහසකි.

(09) මානව විද්‍යාඥයන්ගේ අදහස අනුව ප්‍රාග් ඓතිහාසික මානවයාගේ උපරිම ආයු කාලය,

1. වසර 40 - 45 වේ.  2. වසර 35 - 40 වේ.
3. වසර 30 - 35 වේ.  4. වසර 45 - 50 වේ.

(10) ප්‍රාග් ඓතිහාසික මානවයා වාසය කළ වෙරළාශ්‍රිත එළිමහන් වාසස්ථානයක් නොවන්නේ,

1. බූන්දල  2. පතිරාජවෙල  3. හෝර්ටන් තැන්න  4. මිනිහාගල්කන්ද

(11) මුල් ඓතිහාසික යුගයේ ජනාවාස ව්‍යාප්තව පැවති ප්‍රදේශ පෙන්නුම් කරන ප්‍රධාන දර්ශකය වන්නේ,

1. කුඩා ගම් වැව්වල ව්‍යාප්තිය  2 නිවාසවල නටබුන්
3. නටබුන් වී ගිය ගොඩනැගිලි  4. පැරණි වෙහෙර විහාර

**(12) මහාවංශයේ සඳහන් ' වාපිගාම " සඳහා උදාහරණයක් වූයේ,**

1. **රිදී වාපිගාම**  2. **මුතුවාපිගාම**
3. **සුමනවාපිගාම**  4. **රුවන්වාපිගාම**

**(13) ජනතාව විසින් අතහැර දමූ වැව්ගම් හැඳින්වූයේ**

1. **නියම්ගම්**  2. **ඔළගම්**  3. **පට්ටනගාම**  4. **කසීකාරගාම**

**(14) සිය පාලන මධ්‍යස්ථානය ලෙස අනුරාධපුරය තෝරා ගෙන අනුරාධපුර නගරය විධිමත්ව ගොඩ නැගූ රාජ්‍ය පාලකයා වූයේ,**

1. **දේවානම්පියතිස්ස රජු**  2. වසභ රජු
3. **ධාතුසේන රජු**  4. පණ්ඩුකාභය රජු

**(15) ශ්‍රී ලංකාවේ යකඩ භාවිතා වූ බවට මුලින්ම පැහැදිලි පුරාවිද්‍යාත්මක සාධක හමුවන්නේ,**

1. **මුල් ඓතිහාසික යුගයේ දීය.**  2. **ඓතිහාසික යුගයේ දීය.**
3. **පූර්ව ඓතිහාසික යුගයේ දීය.**  4. **ප්‍රාග් ඓතිහාසික යුගයේ දීය**

**(16) වියළි කලාපයේ වැසියන් වැව් පද්ධතියක් හැඳින්වීමට භාවිතා කරන ලද්දේ,**

1. වැව් ප්‍රපතනය  2. එල්ලංගාව  3 වාරි පද්ධතිය  4. වැව් රළ

(17) ශ්‍රී මහා බෝධීන් වහන්සේ රැගෙන සංඝමිත්තා තෙරණිය ගොඩබට වරාය වන්නේ,

1. දඹකොළපටුන 2 ගෝකණ්ණතිත්ථ 3.. සලාවත්තොට 4. භීමතිත්ථ

(18) අතීතයේ විසි වතාවක් ශ්‍රී ලංකාවෙන් චීනයට රාජ්‍ය තාන්ත්‍රික දූත ගමන් යෙදුනේ කිනම් රජුගේ කාලයේ ද?

1. පළමුවන ගජබා රජු 2. පළමුවන උපතිස්ස රජු

3 හයවන අග්ගබෝධි රජු 4. හතරවන කාශ්‍යප රජු

(19) පැරණි කාලයේ මෙරට විවිධ කර්මාන්ත ක්ෂේත්‍රවල නියුක්ත ශිල්පීන් A තීරයේ දක්වෙන අතර B තීරයේ එම කර්මාන්ත ක්ෂේත්‍ර දක්වේ. A හා B ගැළපූ විට නිවැරදි පිළිතුර තෝරන්න.

| A | | B |
|---|---|---|
| 1. තුලාධාර | A | ඇත් දත් කැටයම් |
| 2. කබර | B | නූල් කැටීම |
| 3. දටික | C | රන් කර්මාන්තය |
| 4. තතවය | D | යකඩ වැඩ |

1. CADB 2. CDAB 3. CBAD 4. DCAB

(20) සුළඟ නිසා ඇතිවන ජල තරංග මගින් වැව් බැම්ම ඛාදනය වීම වැළැක්වීම සඳහා ඉදි කර ඇත්තේ.

1. වැව් බැම්ම 2. පිටවාන 3. බිසෝ කොටුව 4 රළපනාව

(21) ' සකපෝරුව' නමින් හැඳින්වෙන සරල යන්ත්‍රය භාවිතා කර ඇත්තේ කිනම් අමු ද්‍රව්‍යයක් යොදා ගෙන භාණ්ඩ නිපදවීමට ද?

1. ලී 2. මැටි 3. යකඩ 4. නූල්

(22) මෙරට ඉතිහාසයේ ප්‍රථම වරට ඔයක් හරහා අමුණක් තැන වූ පාලකයා ලෙස සැලකෙනුයේ,

1. ඉළනාග රජු 2. මහා පරාක්‍රමබාහු රජු

3 ධාතුසේන රජු 4. දෙවන අග්බෝ රජු

(23) පැරණි සමාජයේ ප්‍රභූත්වයක් හිමි කර ගැනීම සඳහා හේතු වූ වැදගත්ම සාධකය වූයේ,

1. වෙළෙඳාමෙන් ලද ධනය 2. ඉඩම් හිමිකම

3. නිෂ්පාදන අතිරික්තය සඳහා වූ හිමිකම 4. පාරම්පරික දේපල

(24) පැරණි වාස්තු විද්‍යාඥයන් උස ගොඩනැගිලි අකුණු සැර වලින් බේරා ගැනීම සඳහා භාවිතා කළ උපකරණය වන්නේ,

1. සකපෝරුව 2. මොහොල 3. එල්ලංගාව 4. වජ්‍ර චුම්බට

(25) ක්‍රි.ව.9 වන සියවසේ දී රචනා කල සෙල්ලිපියක දක්වෙන සංකේත අතුරින් අඩසඳ ලකුණෙන් අදහස් කර ඇත්තේ,

1. පවිත්‍රත්වය 2. ඉර හඳ පවත්නා තාක් පවතින බව

3. සෞභාග්‍යය 4. ආරක්ෂාව



pdfelement papers.lk

(26) හේන් වගා කිරීම වෙනුවෙන් අය කල " කැති අඩ " හා " කෙටු කනබ " නමැති බදු වර්ග දෙක අහෝසි කල රජතුමා වන්නේ,

1. පළමුවන විජයබාහු රජු
2. කීර්ති ශ්‍රී නිශ්ශංකමල්ල රජු
3. හතරවන මහින්ද රජු
4. කුටකණ්ණ අභය රජු

(27) වළගම්බා රජු දවස ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කරන ලද ස්ථානය වන්නේ,

1. අනුරාධපුර මහා විහාරය
2. කැරගල පද්මාවතී පිරිවෙන
3. මාතලේ අළු විහාරය
4. පොළොන්නරුවේ ලංකාතිලක විහාරය

(28) ක්‍රි.ව. පස්වන සියවසේ දී අනුරාධපුරයේ විසූ පර්සියානු ජාතික වෙළෙඳුන් කණ්ඩායමක් ගැන සඳහන් කළ දේශාටකයා වන්නේ,

1. කොස්මොස් ඉන්ඩිකොප්ලේටස්
2. ඉබ්න් ශහ්රියර්
3. අල් - බලසූරි
4. මෙගස්තිනිස්

(29) දකුණු ඉන්දියානු කුලී හේවායින්ගේ සහාය පැතූ පැරණිතම ශ්‍රී ලාංකික පාලකයින් දෙදෙනා වන්නේ,

1. ඉලනාග රජු හා මහා විජයබාහු රජු
2. අභයනාග රජු හා මහා විජයබාහු රජු
3. මහා විජයබාහු රජු හා වළගම්බා රජු
4. ඉලනාග රජු හා අභයනාග රජු

(30) අතීත ශ්‍රී ලංකාවේ දියුණු වෛද්‍ය තාක්ෂණයක් පැවතුණු බවට ප්‍රබල සාධකය වන්නේ,

1. වෛද්‍යවරුන් ලෙස ප්‍රකට රජවරු පිළිබඳ මූලාශ්‍රවල සඳහන් වීම
2. පැරණි වෙද පොත් මෙරට භාවිතයේ පැවතීම
3. පැරණි රෝහල් ගොඩනැගිලිවල නටබුන් හමුවීම
4. පුරා විද්‍යාත්මක කැණීම්වලින් ශල්‍ය වෛද්‍ය උපකරණ හමුවීම

(31) ක්‍රිස්තු පූර්ව දෙවන සියවසට අයත් සෙල්ලිපියක ඇළ මාර්ග ඉදිකිරීම සම්බන්ධ නිලධාරියා හඳුන්වා ඇත්තේ,

1. මොහොල් නගා
2. මහමත
3. අඩික
4. පත අදෙක

(32) " අහසෙන් වැටෙන එක දිය බිඳක්වත් ප්‍රයෝජනයට නොගෙන මුහුදට යාමට ඉඩ නොදිය යුතුය" යන ප්‍රකාශය සිදුකළ රජතුමා වූයේ.

1. මහසෙන් රජතුමා
2. මහා පරාක්‍රමබාහු රජතුමා
3. වසභ රජතුමා
4. ධාතුසේන රජතුමා

(33) අඹන් ගඟ හරස් කර ඉදි කළ ඇළහැර ඇළෙන් ජලය ගෙන ගිය වැවක් නොවන්නේ,

1. කලා වැව
2. කන්තලේ වැව
3. ගිරිතලේ වැව
4. කවුඩුල්ල වැව



papers.lk pdfelement Remove Watermark Now

(34) පණ්ඩුකාභය රජුගේ පාලන කාලයේ දී අනුරාධපුරයේ ඉදි කොට තිබූ මාතෘ නිවාස පිළිබඳ මහාවංශයේ සඳහන්ව ඇත්තේ මින් කිනම් නමකින් ද ?

1. සිවිකා සාලා
2. පසවන්තිනාමසාලා
3. සොත්ථිසාලා
4. උණ්ණසග්ගරෝගනාස

(35) අතීතයේ "අමුණු" යන මිනුම භාවිතා කරන ලද්දේ,

1. දුර මැනීමටය.
2. බර මැනීමටය.
3. වපසරිය මැනීමටය.
4. කාලය මැනීමටය.

(36) පුරාණ අවධියේ රජුට අයත් ඉඩම්වල වගා කිරීම වෙනුවෙන් ගෙවන ලද බද්ද හැඳින්වූයේ,

1. දකපති
2. මතරමජිබක
3. මාත්‍රික මත්ස්‍ය භාගය
4. බොජකපති

(37) V.O.C. යන ඉංග්‍රීසි අකුරු සහිත කාසි කිනම් රටක වෙළෙඳ සමාගමකට අයත් වූයේ ද ?

1. බ්‍රිතාන්‍ය
2. ඕලන්දය
3. පෘතුගාලය
4. ප්‍රංශය

(38) අතීතයේ මෙරට ප්‍රභූවරුන් අතර ජනප්‍රියව පැවති ආහාරයක් වූයේ සුවඳ ගිතෙලින් පිසූ මොනර මස් හා ඇල් හාලින් සෑදූ බත් බව සඳහන් ග්‍රන්ථය වූයේ,

1. පූජාවලිය
2. පාරමී ශතකය
3. සද්ධර්මරත්නාවලිය
4. ථූපවංශය

(39) සහල් එක් කොටසකට වතුර කොටස් හයක් යොදා රෝගීන්ට සෑදූ කැඳ අතීතයේ හැඳින්වූයේ,

1. යවාගු
2. අඹු
3. දිය කැඳ
4. කොළ කැඳ

(40) අනුරාධපුර පුවරු ලිපියේ උස් ගොඩබිම් ඉඩම්වල කැලෑ නොකැපිය යුතු බවට නියෝගය ලබාදුන් රජතුමා වන්නේ,

1. පස්වන කාශ්‍යප රජු
2. හතරවන උදය රජු
3. කීර්ති ශ්‍රී මේඝවර්ණාභය රජු
4. හතරවන මිහිඳු රජු



pastpapers.lk
pdfelement
Remove Watermark Now

Remove Watermark Now
papers.lk
pdfelement

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Department of Education, Southern Province

33 | S | II

දෙවන වාර පරීක්ෂණය, 2018 ජුලි
Second Term Test, July 2018

10 ශ්‍රේණිය
Grade 10

ඉතිහාසය- II
History - II

පැය තුනයි
Three hours

විභාග අංකය ..............................

- I කොටසේ ප්‍රශ්න අංක 1 අනිවාර්ය වේ
- II කොටසින් ප්‍රශ්න හතරකට ද, III කොටසින් ප්‍රශ්න එකකට ද පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව හයකි

---

## I කොටස

(01) (අ) පහත (I) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ශ්‍රී ලංකා සිතියමෙහි ද (II) යටතේ දක්වා ඇති ස්ථාන සියල්ල ලෝක සිතියමෙහිද ලකුණු කර නම් කරන්න.

(i) පාහියන්ගල, වලවේ ගඟ, යෝධ වැව, ජම්බුකෝලපට්ටන, ගෝකන්න තිත්ථ, මහනුවර, කාලතිත්ථ,උරුවේල, හුරුළු වැව, බූන්දල, කලා ඔය, එලිෆන්ට්පාස් (ල.12)

(ii) පර්සියන් බොක්ක, ගෝව, මලය අර්ධද්වීපය, රෝමය, මදුරාසිය, ඇෆ්ගනිස්ථානය (ල.06)

ආ) (i) පහත A, B, C හා D යටතේ දක්වා ඇති ඓතිහාසික තොරතුරු හා සම්බන්ධ පුද්ගලයින්, ස්ථාන හා ඓතිහාසික මූලාශ්‍ර අනුපිළිවෙලින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න.

A - ප්‍රථම වරට ශ්‍රී ලංකාවේ සිතියමක් නිර්මාණය කළ රෝම ජාතිකයා


B - දේවානම්පියතිස්ස රජු සමග මිත්‍ර සබඳතා පැවැත් වූ ඉන්දීය අධිරාජයා

C - පූර්ව ඓතිහාසික යුගයට අයත් රත්නපුර දිස්ත්‍රික්කයේ පිහිටි සොහොන් බිම

D - දන්ත ධාතූන් වහන්සේ රැගෙන හේමමාලා කුමරිය හා දන්ත කුමරුන් මෙරටට පැමිණි නැව්තොට (ල.04)

(ii) යාබද A සහ B යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යයනය කර අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A. (i) මෙම පින්තූරයෙන් දක්වෙන ශිලා ලිපිය නම් කරන්න




(ii) මෙය ලියා ඇත්තේ කුමන රජු දවස ද ?

(iii) මෙම ශිලා ලිපිය පිහිටා ඇති ප්‍රදේශය කුමක් ද ?

(iv) මෙම ශිලා ලිපියේ ඇති විශේෂත්වය කුමක් ද ? (ල.04)

Remove Watermark Now



B 1. මෙම රූපයෙන් දැක්වෙන සිතුවම කුමක් ද ?

2. මෙම සිතුවම පිහිටි ස්ථානය කුමක් ද ?

3. මෙය කවර රජතුමාගේ වාස භවන ද ?

4. මෙම සිතුවම අයත්වන සියවස කුමක් ද ? (ල.04)

## II කොටස

(02) (i) ශ්‍රී ලංකාවට පැමිණ ඒ පිළිබඳ වාර්තා තබා ඇති පහත සඳහන් කතුවරුන් නියෝජනය කල රට පිළිවෙලින් නම් කරන්න.

A - ඉබන් බතුතා

B - පාහියන් හිමි

C - රොබට් නොක්ස් (ල.03)

(ii) පුරාණ නටබුන් ලෙස ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශවලින් දැකගත හැකි අංග හතරක් සඳහන් කරන්න. (ල.04)

(iii) ඉතිහාසය හැදෑරීමේ දී සෙල්ලිපි වැදගත් සාධකයකි.

A - සෙල්ලිපි වර්ග තුනක් හා

B - සෙල්ලිපිවල වාර්තා කර තිබූ කරුණු දෙකක් ලියන්න (ල.05)

(iv) ශ්‍රී ලංකාවේ ඉතිහාසය හඳුනා ගැනීමට පුරාවිද්‍යාත්මක හා සාහිත්‍ය මූලාශ්‍ර වැදගත් වී ඇති අයුරු කරුණු දෙකක් මගින් පැහැදිලි කරන්න. (ල.06)

pdfs.lk
pdfelement

(03) (i) ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික මානවයා වාසය කළ බවට සාක්ෂි ලැබී ඇති, කැණීම් කරන ලද ස්ථාන තුනක් නම් කරන්න. (ල.03)

(ii) ප්‍රාග් ඓතිහාසික මානවයා ආහාර සඳහා

A - දඩයම් කළ සතුන් වර්ග දෙකක්

B - භාවිතා කළ ශාක ආහාර දෙකක් සඳහන් කරන්න. (ල.04)

(iii) ගල් යුගයේ විසූ මිනිසුන් භාවිතා කළ තාක්ෂණය සම්බන්ධව කරුණු තුනක් ඉදිරිපත් කරන්න. (ල.05)

(iv) ගල් යුගයේ ජනයා තම ජීවන රටාව පවත්වාගෙන ගිය අයුරු කරුණු තුනක් ඔස්සේ කෙටියෙන් විස්තර කරන්න. (ල.06)

(04) (i) ගල් යුගයේ පැවති අභිචාර විධි පිළිබඳ සාක්ෂි සොයාගෙන ඇති ස්ථාන තුනක් නම් කරන්න. (ල.03)

(ii) ඓතිහාසික යුගයේ විවිධ වෘත්තිකයින් වාසය කළ ජනාවාස පහත දක්වේ. ඒවාට භාවිතා කළ නම් වරහන් තුළින් තෝරා පිළිතුරු ලියන්න.

A - ගොපල්ලන් විසූ ගම් -

B - ගොවියන් විසූ ගම් -

C - ධීවරයන් විසූ ගම් -

D - වෙළෙඳ ගම් -

( කේවට්ටගාම, ඔළගම්, ගෝපාලගාම, නියම්ගම්, මාණිකාරගාම, කසීකාරගාම) (ල.04)

(iii) ප්‍රාග් ඓතිහාසික යුගයෙන් පසු පූර්ව ඓතිහාසික යුගයට පරිවර්තනය වීමේදී ඇති වූ වෙනස්කම් තුනක් ඉදිරිපත් කරන්න. (ල.05)

(iv) ශ්‍රී ලංකාවේ පූර්ව ඓතිහාසික යුගයට අයත් ජීවන රටාවේ ස්වරූපය පිළිබඳ සාධක දෙකක් උදාහරණ සහිතව විස්තර කරන්න. (ල.06)

Remove Watermark Now

(05) (i) මුල් ඓතිහාසික යුගයේ ජනාවාස ව්‍යාප්තියට බලපෑ ප්‍රධාන සාධක තුනක් ලියන්න (ල.03)

(ii) පහත සඳහන් කරුණුවලට අදාල සෙල්ලිපි මූලාශ්‍රය වරහන තුලින් තෝරා ලියන්න.

A - දසගම් ඇත්තන් විසින් විහාරයක දානය සපයා ගැනීමේ ගැටලුවක් විසඳීම

B - ගල් ගුහාවක් පූජා කල පරුමකවරයෙකු ' තොට බොජක ' නමින් හඳුන්වා තිබීම

C - සුමනගේ පවුලට අයත් ලෝහ වැඩ කළ ගෘහපතියෙකු භික්ෂූන් වහන්සේලාට ගල්ලෙනක් පිරිසිදු කර පූජා කිරීම

D - සෙන්පතිවරුන් පරුමකයින් ලෙස හඳුන්වා දීම

( පෙරියපුලියන්කුලම, සිතුල් පව්ව, ඇඹුල් ඇඹේ, කොත්ගල්කන්ද, කළුදිය පොකුණ, වෙස්සගිරිය) (ල.04)

(iii) රාජ්‍ය පාලකයාගෙන් රටවැසියාට ඉටුවිය යුතු යුතුකම් තුනක් සඳහන් කර ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල.05)

(iv) ලක්දිව පාලනය කළ ශ්‍රේෂ්ඨ නරපතියෙකු වූ දුටුගැමුණු රජතුමාගේ සේවාවන් දෙකක් විස්තර කරන්න. (ල.06)

(06) (i) පහත දැක්වෙන රාජ්‍යත්ව සංකල්පයට අදාළ රජතුමාගේ නම පිළිවෙලින් නම් කරන්න.

A - දේවත්ව

B - නරේෂ්වර

C - චක්‍රවර්ති

(ල.03)

(ii) මධ්‍යගත පාලනයට සම්බන්ධ පහත දැක්වෙන තැනැත්තන්ගේ නිල නාමයන් පිළිවෙලින් වරහන තුලින් තෝරා නම් කරන්න.

A - සේනාපති

B - නගර පරිපාලක

C - භෝජන ශාලා අධිකාරී

D - අශ්ව අංශයේ ප්‍රධානී

( බතුගු, ශෙනපති, මහමත, නගරගුතික, හති අදෙක, අස අදෙක, නට අදෙක) (ල.04)

(iii) පැරණි ශ්‍රී ලංකාවේ රාජ්‍ය උරුමය ලැබුණු ආකාරය උදාහරණ සහිතව කරුණු දෙකකින් පැහැදිලි කරන්න. (ල.05)

(iv) පොළොන්නරුව රාජධානිය බවට පත් කර ගත් ප්‍රථම පාලකයා වූ මහා විජයබාහු රජතුමාගේ සේවාවන් දෙකක් විස්තර කරන්න. (ල.06)

papers.lk pdfelement

Remove Watermark Now

(07) (i) ශ්‍රී ලංකාවේ පැරණි සමාජයේ වාසය කළ ගැමියන් හේන් ගොවිතැනෙහි දී බහුලව වගා කළ ධාන්‍ය වර්ග තුනක් සඳහන් කරන්න. (ල.03)

(ii) පහත A සිට D දක්වා ඇති එක් එක් ප්‍රකාශයට අදාළ පිළිතුරු වරහන තුළින් තෝරා අනුපිළිවෙලින් ලියා දක්වන්න.

A - ලපනතිස්ස නම් සිත්තරා පිළිබඳ සඳහන් සෙල්ලිපිය

B - රෝමයට තානාපති නිලධාරීන් යවා විදුරු පබළු ගෙන්වා රුවන්වැලිසැයට පූජාවක් පැවැත්වූ රජතුමා

C - හම්බන්තොටින් හමු වූ ලෝහ මුද්‍රාව අයත් වූ විදේශීය වෙළෙඳ සංවිධානය

D - චේර රාජ්‍යයේ පත්තිනි දේවාලයක් විවෘත කිරීමට ගිය රජතුමා

(නනාදේසි, පළමුවන ගජබා, අයින්නුරුවර්, නැට්ටුකන්ද, මහසෙන්, භාතිකාභය, කොත්ගල්කන්ද) (ල.04)

(iii) ඉතා පුරාණ කාලයක සිට මෙරට පැවති කර්මාන්ත තුනක් ඊට අදාළ මූලාශ්‍ර ද සහිතව හඳුන්වන්න. (ල.05)

(iv) සොරබොර වැව ටැම්ලිපියේ සඳහන් වෙළෙඳ නීති තුනක් සඳහන් කර ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න (ල.06)

## III කොටස

(08) (i) ඈත අතීතයේ සිට මෙරට නගරවල වෙළඳාම සඳහා පැමිණි වෙනත් ආගම් හා සංස්කෘතීන්ට අයත් ජන කණ්ඩායම් තුනක් නම් කරන්න. (ල.03)

(ii) පහත සඳහන් වාරි පද්ධති ගොඩනැගීමට අනුග්‍රහය දැක්වූ රජවරුන් පිළිවෙලින් නම් කරන්න.

A - කලා වැව

B - මින්නේරිය වැව

C - තිසා වැව

D - බසවක්කුලම වැව (ල.04)

(iii) අප රටේ මුතුන් මිත්තන්ගේ විස්මිත දැනුමේ ස්වභාවය ජල කළමණාකරණය තුළින් විදහා දැක්වේ.

A - වැවක ප්‍රධාන අංග තුනක් නම් කරන්න

B - මහ වැව් සෑදීමේ අරමුණු දෙකක් සඳහන් කරන්න. (ල.05)

(iv) ඉතා පුරාණයේ පටන් ශ්‍රී ලංකාවේ යකඩ නිස්සාරණ තාක්ෂණය පැවැති බව කරුණු දෙකක් මගින් පැහැදිලි කරන්න. (ල.06)

(09) (i) අතීතයේ දී පහත සඳහන් නීති පැන වූ රජවරුන් වරහන තුළින් තෝරා ලියන්න.

A - විනිශ්චය ශාලාවෙන් ලැබෙන දඩ මුදල් භික්ෂූන් වහන්සේලාගේ සිව්පසය සපයා ගැනීමට පූජා කිරීම

B - කිසිදු සතෙකු නොමැරිය යුතු බව " මාඝාත නීතිය"

C - වැව්වලින් ගොවිතැන් කරන කුඹුරුවල සිහිනැටි වී මිස මුංඇට වැපිරීම නොකල යුතු බව

(අමණ්ඩ ගාමිණී අභය රජු, වට්ටගාමිණී අභය රජු, හතරවන මහින්ද රජු, පළමුවන ගජබාහු රජු, හතරවන උදය රජු) (ල.03)

(ii) බෞද්ධ විහාරාරාමවල විසූ භික්ෂූන්වහන්සේලාගේ ප්‍රයෝජනය සඳහා ඉදිකරන ලද පොකුණු හතරක් නම් කරන්න. (ල.04)


(iii) පැරණි කාලයේ ශ්‍රී ලංකාවේ සමාජය කාන්තාවන් හට ඉතා ගෞරවයෙන් සලකා ඇත.

A - රාජ්‍ය පාලනයේ නිරත වූ රැජිනන් දෙදෙනෙකු ද

B - කාන්තා නායිකාවන් ප්‍රාදේශීය පාලනයට සම්බන්ධ වූ අවස්ථාවක් ද කෙටියෙන් සඳහන් කරන්න.(ල.05)

(iv) කෘෂිකර්මාන්තයේ යෙදී සිටි අතීත ජනයා යාතුකර්ම පූජා හා කෙම් පහන් ක්‍රම භාවිතා කළ බව කරුණු දෙකක් මගින් විස්තර කරන්න. (ල.06)

# ලංකා සිතියම



Remove Watermark Now
pastpapers.lk
pdfelement

## ලෝක සිතියම

